# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2151/58 - 2019 නොවැම්බර් මස 29 වැනි සිකුරාදා - 2019.11.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

විධාන අංක 70.

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10(1)(අ) වැනි වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතෙහි 10(1)(අ) වගන්තිය යටතේ බලතල ප්‍රකාරව ක්‍රියා කරමින්, සියළු ආහාර එතුම් (Lunch sheets) නිෂ්පාදකයින් හා වෙළෙඳුන් විසින් එම එක් එක් ආහාර එතුම් සහිත පැකට්ටුවකම හෝ බණ්ඩලයකම පහත සඳහන් තොරතුරු ඇතුළත් භාෂා ත්‍රිත්වයෙන්ම සැකසූ ලේබලයක් අඩංගු කළ යුතු බවට මෙයින් විධාන කරනු ලැබේ.

(1) සන්නම් නාමය
(2) උපරිම සිල්ලර මිල
(3) නිෂ්පාදකයාගේ නම සහ ලිපිනය
(4) නිෂ්පාදිත දිනය හා ආයු කාලය (Shelf Life)
(5) භාවිතා කරන ලද ද්‍රව්‍ය (නුමුහුන් PLA, Starch, PABT යනාදී වශයෙන්)
(6) භාවිත ද්‍රව්‍ය පිළිබඳ ප්‍රකාශනය (ආහාර සඳහා භාවිතයට සුදුසු සහ ජෛවභාවයට ලක්වන/කොම්පෝස්ට් කළ හැකි)
(7) මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි අංකය
(8) එතුමක ප්‍රමාණය (සෙන්ටිමීටර/අඟල් වලින්)
(9) පැකට්ටුවක හෝ බණ්ඩලයක අඩංගු එතුම් සංඛ්‍යාව

මෙම විධානය වර්ෂ 2020 ජූනි මස 01 වන දින සිට බලපැවැත්වෙනු ඇත.


1A - PG 4776 — 217 (2019/11)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් 2009.02.11 දින අංක 1588/18 දරන ලංකාණ්ඩුවේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද අංක 29 දරණ විධානය මෙමගින් පරිච්ජින්න කරනු ලැබේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

ආචාර්ය ලලිත් එන්. සෙනවීර,
සභාපති.

2019 නොවැම්බර් මස 27 වැනි දින,
කොළඹ දීය.

12-519

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.